මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

# වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම

# ANNUAL RETURN & ANNUAL REPORT

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සංස්ථාපිත සමාගම් අතරින් සමහරක් වාර්ෂිකව ගොනු කළ යුතු වාර්ෂික වාර්තා (අංක 15 /15A ආකෘති පත්‍ර) ගොනු නොකරන බව නිරික්ෂණය වී ඇත.

සංස්ථාපිත සෑම සමාගමක්ම සමාගම් පනතේ 133 (1) වගන්තිය යටතේ වාර්ෂික මහා සභා රැස්වීම පවත්වා, වාර්ෂික වාර්තාව (අංක 15 /15A ආකෘති පත්‍ර මගින්) වැඩ කරන දින 30ක් තුළ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත නියමිත ගාස්තුව ගෙවා භාරදිය යුතුය. වාර්ෂික රැස්වීමක් නොපවත්වන්නේ නම් සමාගම් පනතේ 144 (3) වගන්තිය අනුව ක්‍රියාකර වැඩ කරන දින 30ක් තුල වාර්ෂික වාර්තාව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුයි.

සමාගම් පනතේ 131(1) වගන්තිය අනුව ක්‍රියා නොකරන සෑම සමාගමක් සම්බන්ධව පනතේ 131(4) වගන්තිය අනුව රු. 100,000/- නොඉක්මවන දඩ මුදලකටද, පැහැර හැරීමට සම්බන්ධ එබඳු සමාගමක සෑම නිලධාරියෙක්ම (අධ්‍යක්ෂකවරු) රු. 50,000/- නොඉක්මවන දඩ මුදලකට යටත් වේ.

එබැවින් සමාගම් පනත යටතේ සංස්ථාපිත සියලුම සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට, ලේකම්වරුන්ට, ප්‍රවර්ධකයන්ට හා උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශවයන්ට නියමිත කාලය තුල වාර්ෂික වාර්තා ගොනු කිරීමට වග බලාගන්නා ලෙස මෙයින් අවවාද කරන අතර, පැහැර හැරීම සිදු කරනු ලබන තැනැත්තන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනිම දැනටමත් ආරම්භ කර ඇති බව දන්වා සිටිමි.

ඔබගේ පහසුව පිණිස සෙනසුරාදා දිනවල පෙ.ව 9.00 සිට ප.ව 2.00 දක්වා මෙම කාර්යාලය විවෘත කර ඇත.

DRAFT

**සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

සමාගම් මැඳුර,

අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10